(4)

මගේ අංකය : NYSC/ TVTD/ම.පොදු/ 2018

2018/03/21

ජාතික තරුණ සේවා සභාවේ,
සියළුම පළාත් අධ්‍යක්ෂවරුන් හා
මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත.

o/c

**<u>ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන වර්ගීකරණය, පාඨමාලා ගාස්තු සංශෝධනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම.</u>**

උක්ත කරුණට අදාලව ඉදිරිපත් වූ සභා සංදේශ 06/2017 සඳහා ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. එහි සඳහන් පාඨමාලා ගාස්තු සංශෝධනය, යෝජිත ගාස්තු සංශෝධනය සඳහා අතිරේක ආදායම පාඨමාලාවන්හි අඛණ්ඩ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම සහ මධ්‍යස්ථාන ශ්‍රේණිගත කිරීම යන කරුණු පිළිබඳව මේ වන විට අවශ්‍ය උපදෙස් NYSC/TVTD/ම.පොදු/2017 හා 2017.12.29 දිනැති ලිපියෙන් යොමු කර ඇත.

එමගින් අනුමත කරන ලද පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි.

1. නේවාසික පුහුණු පාඨමාලා පැවැත්වෙන පුහුණු මධ්‍යස්ථානවල මධ්‍යස්ථාන භාර නිලධාරී හෝ ඒ වෙනුවට රාත්‍රී කාලයේ සේවය කරන කාර්ය භාර නිලධාරීන් සඳහා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර ආදායම් ඉපයීම් ප්‍රතිපාදන තුළින් නේවාසිකව රාජකාරී ඉටු කරන එක් දිනයක් වෙනුවෙන් (පැය 24ක අඛණ්ඩ සේවා කාලයක් වෙනුවෙන්) 10%ක රාජ්‍ය භාරය ගෙවීමට යටත්ව රු.750.00ක දීමනාවක් ගෙවීම, එම දීමනාව අදාල පුහුණු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර ආදායමෙන් පමණක් ගෙවීම් සිදු කෙරන අතර ගොවිපළ ක්‍රියාත්මක වන මධ්‍යස්ථානවල කෘෂි සංවර්ධන අංශයේ අදාල මධ්‍යස්ථාන අභ්‍යන්තර ආදායම් ප්‍රතිපාදන තුළින් ගෙවීම් කිරීම සිදු කළ යුතුය.

2. සති අන්ත පාඨමාලා පැවැත්වෙන පුහුණු මධ්‍යස්ථානවල කාර්යාල හා මෙහෙයුම් කටයුතු සඳහා මධ්‍යස්ථාන භාර නිලධාරීවරුන් සති අන්ත දිනවල සේවය කළ යුතු අතර පාඨමාලා පැවැත්වෙන කාලසීමාව තුළ (08.30-04.30) සේවය කිරීම වෙනුවෙන් සංයුක්ත දීමනාවට සමාන දීමනාවක් ගෙවීම සිදු කරන අතර මෙම දීමනා අභ්‍යන්තර ආදායම් තුළින් ගෙවිය යුතුය.

   මෙම දීමනාව සඳහා හිමිකම් ලැබෙන්නේ සති අන්ත සේවය සඳහා හිලව් නිවාඩු ලබා (නො) ගන්නේ නම් පමණක් බව සැළකිය යුතුය.

3. වෘත්තීය පුහුණු පාඨමාලාවන්හි ඉගැන්වීම් කරන ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා වාර්ෂිකව ධාරිතා සංවර්ධනයට අදාල පාඨමාලාවන් අවම වශයෙන් එකක්වත් හදාරා තිබීම අනිවාර්යය කිරීම සහ වාර්ෂික වැටුප් වර්ධක හෝ දීමනා ගෙවීමේදී එය නිර්ණායකයක් ලෙස සලකා බැලීම කළ යුතුය.

එහෙයින් ඉහත උපදෙස් අනුව කටයුතු කරන ලෙසත්, දීමනා ගෙවීම සඳහා ආදායම් විස්තර සමග තොරතුරු ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලෙසත් වැඩිදුරටත් දන්වමි.

O/C

එච්.ඩී. සුනිල් කරුණාරත්න,
අධ්‍යක්ෂ (පුහුණු),
ජාතික තරුණ සේවා සභාව,
මහරගම.

පිටපත් :

1. සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්තුමා - කා.දැ.පි.
2. අධ්‍යක්ෂ (පාලන/මුදල්/සංවර්ධන) - කා.දැ.පි.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.පි.
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන/මුදල්/සංවර්ධන/කා.වෘ.පු./විභාග/සුභසාධන) - කා.දැ.පි.
5. සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ සැලසුම්/කාර්ය මණ්ඩල පුහුණු හා ඇගයීම්)- කා.දැ.පි.
6. සභා ලේකම් - කා.දැ.පි.